# තල් සංවර්ධන මණ්ඩලය
### වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## පුරප්පාඩු

**තල් සංවර්ධන මණ්ඩලයේ පහත පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ.**

### 1. තනතුර - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තනතුරු 01)

**සුදුසුකම්;**

බාහිර බඳවා ගැනීම්;

කළමනාකරණය/ විද්‍යාව/ කෘෂිකර්මය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූලික උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ සමාගමක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වසර 15ක පළපුරුද්ද.

අභ්‍යන්තර බඳවා ගැනීම්;

ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කළමනාකරු (MM-1-1) කාණ්ඩයේ 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර (05) ක් සම්පූර්ණ කර තිබීම.

**වයස;**

අවුරුදු (35ට නොඅඩු අවුරුදු 55ට නොවැඩි) අයවළුන් විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් කාණ්ඩය : HM 1-1**

වැටුප් ප්‍රමාණය: රු. 80,295/- (2,270×15) - 114,345/-

### 2. අභ්‍යන්තර විගණක තනතුර MM 1- 1 (තනතුරු 01)

**සුදුසුකම්;**

බාහිර බඳවා ගැනීම්;

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් රාජ්‍ය කළමනාකරණ/ මූල්‍ය ව්‍යාපාර පරිපාලන/ කළමනාකරණ/ කෘෂිකර්මය/ විද්‍යාව/ නීතිය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර (03) ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර බඳවා ගැනීම්;

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ පළමු ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස;**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් කාණ්ඩය: MM 1-1**

වැටුප් ප්‍රමාණය: 2016 රු.(53,175-10×1,375-15×1,910-95,575/-)

**පොදු:**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරිය හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය .
- බඳවා ගැනීමේ ක්‍රමය: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් තුළින් සිදු කෙරේ.

ජීවදත්ත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීමය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් අයදුම්කරුවන් තම අත්සන යෙදූ අයදුම්පත්‍ර, ඔබගේ සුදුසුකම් සනාථ කිරීමේ සහතික පත්‍ර වල පිටපත් සමග යොමු කළ යුතුය. රාජ්‍ය සේවය/සංස්ථා/මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු අය තම අයදුම් පත්‍ර අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සියළුම අයදුම්පත්‍ර **2023.02.20** හෝ එදිනට පෙර **"සභාපති, තල් සංවර්ධන මණ්ඩලය, නො. 498, ගාලු පාර, කොළඹ 06"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේ නම් ඒ සම්බන්ධව බඳවාගැනීමේ බලධරයා විසින් තීරණය කරනු ලැබේ. මේ සම්බන්ධව කිසියම් බලපෑමක් කිරීම නුසුදුසු වීමට හේතු වනු ඇත.

සභාපති,
**තල් සංවර්ධන මණ්ඩලය,**
නො. 498, ගාලු පාර,
කොළඹ 06.